# සිසුන් පොත් නොකියවීම

සිංහලෙන් අධ්‍යාපනය දුන් පාසල්වල ඉහළ පන්තිවල හා විශ්වවිද්‍යාලවල සිසුන් බොහොමයක් එදිරිවීර සරච්චන්ද්‍ර හා ඇම්. ජේ. පෙරේරා මහත්වරුන්ගේ මූලිකත්වයෙන් බිහි වූ ඊනියා සිංහල විදග්ධ සංස්කෘතිය වැළඳ නොගත්තේ ඇයි ද යන ප්‍රශ්නය සාකච්ඡා නොකර ඒ සිසුන්ට පොත් නොකියවීම පිළිබඳ ව බැණවැදීම සුදුසු කාර්යයක් නො වෙයි. විශේෂයෙන් ම ඉංගිරිසියෙන් අධ්‍යාපනය ලැබූ සිසුන් කලකට පෙර ඒ සංස්කෘතිය වැළඳ ගැනීමත් පසුව සිංහලෙන් අධ්‍යාපනය ලැබූ හා ලබන සිසුන් ඒ සංස්කෘතිය වැළඳ නොගැනීමටත් හේතුව කුමක් ද?

අද බොහෝ ප්‍රබුද්ධයන් යැයි කියාගන්නා අය මේ ප්‍රශ්නයට දෙන්නේ එකම එක පිළිතුරක් පමණකි. ඔවුන්ට අනුව මේ සිසුන් පොත් නොකියවන්නේ ඔවුන් ඊනියා ද්විභාෂිකයන් නොවීම නිසා ය. එනම් මේ සිසුන් ඉංගිරිසි නොදැනීම එයට හේතුව ය. සිසුන්ගේ ඉංගිරිසි දැනුමෙහි මඳ බව හේතුවෙන් සිසුහු පොත් නො කියවති යන්න මේ ඊනියා ප්‍රභූන්ගේ සරල පිළිතුර වෙයි. මේ සිසුන් යනු ශාස්ත්‍ර ධාරාවන්ට අයත් වූවන් ය යන්න පැහැදිලි ය.

මෙහි දී පරස්පර දෙකක් මතුවෙයි. පළමුවෙන් ම මේ සිසුන් සිංහල පොත් ද නොකියවන්නේ ඇයි ද යන්න ය. ඔවුන් විභාගයකට නියම කර නොමැති නවකතාවක් හෝ කෙටි කතාවක් හෝ සිංහලෙන් ලියුව ද නොකියවන්නේ ඇයි? දෙවනුව දැනට අවුරුදු විස්සකට කලින් සිටි සිසුන්ට වඩා අද සිසුන්ගේ, විශේෂයෙන් ම විද්‍යාව හදාරණ සිසුන්ගේ ඉංගිරිසි දැනුම ඉහළ ය. එසේ වුවත් ඔවුහු ද නවකතා කෙටි කතා පමණක් නොව තම විෂය ක්ෂෙත්‍රයෙහි ද ලියැවී ඇති පොතපත නො කියවති. ඔවුන් පොත් නොකියවන්නේ ඉංගිරිසි දැනුමෙහි මඳ බව නිසා යැයි කිව නො හැකි ය.

තවත් අය සිසුන් පොත් නොකියවීමේ හේතුව ලෙස දකින්නේ පවත්නා තරඟ විභාග ක්‍රමය ය. විභාගවලට සූදානම් වීම සඳහා පාඩම් කරනවා හැරෙන්නට පොත් කියවීමට සිසුන්ට කාලයක් නොමැති යැයි ඔවුහු කියති. මෙය ද සත්‍යයක් නො වේ. විශ්වවිද්‍යාලවල අද විෂයමාලා ඒකක ක්‍රමය යටතේ සිසුන්ට පොත් කියවීමට කාලයක් නොලැබෙන්නේ යැයි කිව හැකි නමුත් දැනට අවුරුදු පහළොවකට පමණ පෙර එවැනි තත්වයක් නො වී ය. එහෙත් එවකට ද පොත් කියවූයේ කිහිප දෙනකු පමණ ය. එදා පොත් නොකියවූවෝ ද අද තමන් පොත් කියවූ බව කියා සිටිති. එදා විශ්වවිද්‍යාලවල නවක වදයක් නොතිබිණි යැයි කීවත් එදා ද අද මෙන් අමානුෂික වද තිබූ බව මම පෞද්ගලිකව ම දනිමි. අදත් කිහිප දෙනකු පොත් කියවන බව අමතක නොකළ යුතු ය.

මෙහි දී ද සිදුවන්නේ ගැහැණියක් කතා සංග්‍රහය පිටපත් දාහක් විකුණාගැනීමට මාර්ටින් වික්‍රමසිංහ මහතාට අවුරුදු ගණනක් බලා සිටීමට සිදුවීම වැනි වූවකි. එදා ද සිංහලෙන් පළකෙරිණ ද බටහිර අච්චුවේ පොත් කියවූවෝ සුළු පිරිසක් පමණක් වූහ. එදා පාසල් සිසුන් හා සරසවි සිසුන් අතර පොත් කියවූවන්ගේ ප්‍රතිශතය අදට වඩා වැඩිවීම එතරම් පුදුමයක් නො වෙයි. එදා උසස් පෙළ පරීක්ෂණයට පෙනී සිටියේ කිහිප දෙනකු පමණ ය. මේ සිසුහු සමාජයේ බුද්ධිමය අරටුව ලෙස සලකණු ලැබූහ.

මෙහි දී අපට වැදගත් සංකල්පයක් සාකච්ඡාකිරීමට සිදුවෙයි. බුද්ධිමය අරටුව යන්නෙන් හැඳින්වෙන්නේ කුමක් ද? එයට අයත්වන්නෝ කවරහු ද? අද සමාජයේ බුද්ධිමය අරටුව යන්නෙන් අදහස් කෙරෙන්නේ සංකල්ප, ප්‍රවාද, ප්‍රමේය ආදිය නිර්මාණය කරන්නන් නොව වැඩි වැඩියෙන් උගත්කම ලැබූවන් ය. මේ උගත්කම යනු අනෙකක් නොව බටහිර දැනුමෙන් හිස පුරවාගැනීම ය. ඇතැම් විට එවැනි උගතුන්ට විචාරාත්මක හැකියාවක් ද තිබෙනු හැකි ය. එහෙත් එය ද බටහිර විචාරාත්මක හැකියාවකි. එනම් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි පදනම් වූ උගත්කමක් හා විචාරාත්මක හැකියාවක් මොවුන්ට ලැබෙයි.

පාසල්වල හා විශ්වවිද්‍යාලවල ඉගැන්වෙන විෂය කුමක් වුව ද ගණිතයෙහි සිට සාහිත්‍ය විචාරය දක්වා ඇත්තේ බටහිර ක්‍රමය මිස අනෙකක් නො වෙයි. වියුක්ත බව යුදෙව්වන්ට පමණ නැතිවුවත් මෙරට ඒ තරමක් ඇති අය බොහෝ විට ගණිතය භෞතික විද්‍යාව ආදී විෂය හදාරති. සාහිත්‍යය හැදෑරීමට එතරම් වියුක්තබවක් අවශ්‍ය නො වේ. එහෙත් ඒ කුමක් හැදෑරූවත් ඒ කෙරෙන්නේ ඇරිස්ටෝටලීය න්‍යාය පදනම් කරගත් බටහිර ආකෘතියෙහි ය. ප්‍රශ්නය වනුයේ මේ

© Prof. Nalin De Silva

ආකෘතියෙහි දැනුම ලබාගැනීමට සමත් කිනම් ප්‍රතිශතයක් සිංහල බෞද්ධ සමාජයෙන් බිහිවන්නේ ද යන්න ය. උපාධිධාරියෙක් යනු මේ ආකෘතියෙහි යම් ප්‍රමාණයක ඉහළ දැනුමක් ලබාගත්තෙක් පමණක් වෙයි.

බටහිර ආකෘතියෙහි නිර්මාණය කෙරී ඇති දැනුම ලබාගැනීම බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි කිමිදී ඇති තරමට පහසු වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ පළමු පංතියෙහි උපාධි ඒ සංස්කෘතියෙහි හා චින්තනයෙහි වඩාත් ම කිමිදී ඇති අයට ලැබෙන්නේ ය යන්න නො වේ. බටහිර අධ්‍යාපන රටාව අනුව එහි එතරම් කිමිදී නැතිවුවත් උපාධියක් උගත්කමක් ලබාගත හැකි ය. එහෙත් ඒ මහන්සි වී අමාරුවෙන් ලබාගන්නා උගත්කමකි. බටහිර සංස්කෘතියෙහි හා චින්තනයෙහි කිමිදෙත් ම බටහිර උගත්කම ලබාගැනීම පහසු වෙයි. එමෙන් ම පාසලේ උසස් පෙළ පන්තිවල හෝ විශ්වවිද්‍යාලවල හෝ ඉගෙන නොගෙන ද බටහිර උගත්කමක් පොතපත කියවීමෙන් පමණක් වුව ද ලබාගත හැකි ය. එහිදී ද අදාළ පුද්ගලයා බටහිර සංස්කෘතියෙහි හා චින්තනයෙහි කිමිදී ඇති ප්‍රමාණයට ඒ පහසු වෙයි. මාර්ටින් වික්‍රමසිංහ, ජී. බී. සේනානායක ආදී මහත්වරු තම තමන් ම පොත්පත් කියවා බටහිර උගත්කමක් ලැබුවෝ වෙති.

උපාධිධාරියකු, පශ්චාත් උපාධිධාරියකු වූ පමණින් කිසිවකු බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බුද්ධිමතකු වන්නේ යැයි නොසිතිය යුතු ය. එලෙස බුද්ධිමතකු වීමට නම් ඒ සංස්කෘතියෙහි සංකල්ප, ප්‍රවාද, ප්‍රමේය ආදිය නිර්මාණය කිරීමේ හැකියාව ලැබූවකු විය යුතු ය. ඒ සඳහා බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ඉතා ගැඹුරට කිමිදිය යුතු ය.  එහෙත් එවැන්නන් ලංකාවෙහි දැකිය නො හැකි ය. ලංකාවේ ඇත්තේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි දැනුම් ලැබූ උගතුන් ය. ඔවුන් බටහිර සංස්කෘතියෙහි හා චින්තනයෙහි සුළු සුළුවෙන් කිමිදී ඇති මුත් ඉතා ගැඹුරට කිමිදී ඇතැයි කිව නො හැකි ය. ඉතා පැහැදිලිව මෙරට ප්‍රධාන සංස්කෘතිය වූ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි හා මෙරට අනෙක් සංස්කෘතීන්හි බටහිර අච්චුවේ බුද්ධිමත්තු නිර්මාණය නො වෙති. එනම් මෙරට බටහිර අච්චුවෙහි බිහිවන බුද්ධිමතුන්ගේ ප්‍රතිශතය ශුන්‍යය වෙයි.

මෙරට බටහිර අචිචුවෙගි බිහිවන උගතුන්ගේ සංඛ්‍යාව ශුන්‍යය නොවුවත් ඒ ඉතා ඉහළ අගයක් නො වෙයි. ඒ නිවැරදිව නිශ්චිතව කීමට තරම් මා ඒ පිළිබඳ ගවේෂණයක් කර නැත. එමෙන් ම බටහිර සංස්කෘතියෙහි හා චින්තනයෙහි තරමක් කිමිද උගතුන් වන සංඛ්‍යාව මුළු උගතුන් සංඛ්‍යාවට වඩා අඩුවිය යුතු බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. මෙරට බටහිර සංස්කෘතියෙහි හා චින්තනයෙහි යම් පමණකින් වුව ද කිමිදිය හැකි අයගේ ප්‍රතිශතය අඩු අගයක් ගන්නා බව පැහැදිලි ය. මේ ප්‍රතිශතයෙන් විශාල කොටස පාසල් හා විශ්වවිද්‍යාල ඔස්සේ බිහිවන අතර සුළු ප්‍රමාණයක් පාසල් හා විශ්වවිද්‍යාල පද්ධතියෙන් බාහිර ව බිහිවනු දැකිය හැකි ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා වැන්නෝ එලෙස පාසල් හා විශ්වවිද්‍යාල පද්ධතියෙන් පරිබාහිර ව බිහිවූවෝ වෙති.

ඇතැමුන් සාංසාරික පුරුද්ද නිසා බටහිර සංස්කෘතියෙහි හා චින්තනයෙහි යම් පමණකට කිමිදී ඇති අතර තවත් පිරිසක් පාසලේ දී හා විශ්වවිද්‍යාලයේ දී ද තවත් අය සවයං අධ්‍යයනයකින් ද එහි කිමිදෙති. සාංසාරික පුරුද්ද ඇති තැනැත්තා පාසලේ දී හා විශ්වවිද්‍යාලයේ දී එලෙස කිමිදීමට ඇති හැකියාව වැඩිකරගන්නවාට සැකයක් නැත. එහෙත් පාසල් හා විශ්වවිද්‍යාල පද්ධතිය මගින් ලන්දේසීන් මෙරට මුහුදුබඩ පළාත් පාලනය කළ අවධියෙහි සිට කෙරෙන්නේ මෙරට වැසියන් හැකිතාක් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි කිමිදවීම ය. ඒ ඒ පුද්ගලයා එහි කිමිදෙන්නේ කිනම් ප්‍රමාණයකින් ද යන්න විවිධ හේතු මත තීරණය වෙයි.

ලන්දේසීන්ට ද වඩා බ්‍රිතානීහු මේ සංස්කෘතිය හා චින්තනය අප මත පැටවීමට උත්සාහ ගත්හ. ඔවුන් නිර්මාණය කළ පාසල් පද්ධතිය ඒ සඳහා ම විය. දක්ෂ සිසුන්ට ශිෂ්‍යත්ව ලබාදීමෙන් ඔවුන් බලාපොරොත්තු වූයේ ද දක්ෂයන් ඔවුන්ගේ සංස්කෘතියෙහි ගිල්වාගැනීම ය. එහෙත් බ්‍රිතානීන්ට තිබුණේ සීමාසහිත අපේක්ෂාවකි. ඔවුන්ට අවශ්‍ය වූයේ ඔවුන්ගේ අධ්‍යාපනය ලබා ඔවුන්ට සේවය කළහැකි පිරිසක් බිහිකර ගැනීම ය. ඒ සිවිල් සේවය හෙවත් ඉහළ පරිපාලන සේවයේ සිට කම්කරු වෘත්තිය දක්වා විහිදිණි. ඔවුන්ගේ අධ්‍යාපනයෙන් බිහිවූ ඊනියා පර්යේෂකයෝ ද ඔවුන්ගේ ප්‍රවාද තහවුරුකිරීමට දත්ත සැපයුවෝ හෝ ඒ ප්‍රවාද ඇසුරෙන් මෙරට දත්ත විවරණය කළ අය හෝ පමණක් වූහ. බ්‍රිතානීහු මෙරටින් ප්‍රවාද නිර්මාපකයන් බිහිකර ගැනීමට බලාපොරොත්තු නො වූහ. අද එය ඔවුන්ට ප්‍රශ්නයක් වී ඇති බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

කෙසේ වෙතත් ලන්දේසීන්ට හා බ්‍රිතාන්‍යයන්ට පාසල් හා විශ්වවිද්‍යාල පද්ධතිය ඔස්සේ ද ඔවුන්ගේ දැනුම ඇතුළත් පොතපත මගින් ද බිහිකර ගත හැකිවූයේ ඔවුන්ගේ සංස්කෘතියෙහි හා චින්තනයෙහි දණක් පමණ ගිළුණු පිරිසකි. සිංහල බෞද්ධ සංස්කෘතියෙන් බ්‍රිතාන්‍යයන්ගේ ප්‍රයත්නයට කිසිම තල්ලුවක් නොලැබුණු බැවින් මෙරටින් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි යම් පමණකට වුවත් කිම්දි පිරිසක් බිහිකරගැනීම එතරම් සාර්ථක නො විණි. එසේ සුළුවෙන් වුවත් කිම්දි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ගත්කල ඉතා කුඩා විය. ලංකාවේ බටහිර ක්‍රමයේ උසස් අධ්‍යාපනය ඇරඹීමෙන් පසු මුල් අවධියෙහි පාසලේ ඉහළ පංතිවල හා විශ්වවිද්‍යාලවල ඉගෙනගත් සිසුහු සියළු දෙනාම පාහේ මේ ප්‍රතිශතයට අයත්වූහ. ඔවුහු බටහිර අච්චුවේ නවකතා හා කෙටි කතා කියවූහ. බටහිර සංගීතය ප්‍රගුණ කළහ. ඉංගිරිසියට අමතරව ඊනියා ශාස්ත්‍රීය කටයුතු සඳහා වෙනත් යුරෝපීය භාෂා හැදෑරූහ. ඔවුහු සෑගෙන ප්‍රමාණයක් බටහිර අච්චුවේ වෙනත් පොතපත ද කියවූවෝ වූහ.

එහෙත් උසස් අධ්‍යාපනය පුළුල්වීමත් සමග සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදීමත් සමග මේ තත්වය වෙනස්වීමට පටන්ගත්තේ ය. දැන් උසස් අධ්‍යාපනය ලැබූවන්ගෙන් විශාල ප්‍රතිශතයක් අර සිංහල සමාජයෙන් බටහිර සංස්කෘතියෙහි හා චින්තනයෙහි ඉතා සුළුවෙන් කිම්දි අය එසේත් නැතහොත් ඒ සංස්කෘතියෙහි හා චින්තනයෙහි යම්තමින් පයගැසුවෝ වූහ. ඔවුන් සිංහල ගැමි සංස්කෘතියෙන් වෙන්කිරීම පමණක් පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් සිදුකෙරිණි. බටහිර සංස්කෘතියෙහි හා චින්තනයෙහි යම්තමින් පා ගැසූ මේ පිරිසට බටහිර අච්චුවේ පොතපත කියවීම රුචි නො වේ. ඔවුන් ලවා බටහිර අච්චුවේ නවකතා හා වෙනත් පොත් කියවීමට බලාපොරොත්තුවීම ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලීමක් පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva